දිවි තොර කරගැනීම් මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් සලකමින් වාර්තා කළ යුතු බවට සැකයක් නැත. කෙසේ වෙතත්, මාධ්‍ය විසින් දිවි තොර කරගත් ආකාරයන්, එහි විස්තරාත්මක තොරතුරු, හැඟීම් කළඹවන සුළු ලෙසින් වාර්තා කිරීම ඔස්සේ, අනුකාරක සිදුවීම් ද ඇති විය හැකි බව පර්යේෂකයින් පවසයි. එය වර්දර් ආවරණය (Werther effect) ලෙසින් හැඳින්වේ.
යාපනයේ රන්බඩු අලෙවි සැලක සේවිකාවක් දිවි තොර කර ගැනීමත්, ඒ බව ආයතන හිමිකරුට දැනුම්දීමෙන් අනතුරුව, එදිනම, ඔහුද එම ක්‍රමයම අනුගමනය කරමින් දිවි තොර කරගැනීමත්, මාධ්‍ය අවධානයට ලක්ව තිබිණි.
Daily Mirror පුවත්පතේ ඒ පිළිබඳ වාර්තා වී තිබුණේ මේ ආකාරයෙනි.
* දිවි තොර කරගත් ආකාරය සිරස්තලය සහ පුවත් අන්තර්ගතය යන දෙකම තුළ දැක්වී තිබිණි.
* එදින පුවත්පතේ මුල් පිටුවෙහි පළ කර ඇත.
* හදිසි උපකාරක අංක සඳහන්ව නොතිබුණි.
Daily Mirror මෙම පුවත හදිසි උපකාරක අංකද ඇතුළත් කරමින් වාර්තා කළේ නම්, එසේම, දිවි තොර කරගත් ආකාරය නොදැක්වූයේ නම්, එය වඩාත් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වාර්තාකරණයක් නොවන්නට තිබුණේ ද?
හදිසි උපකාරක අංක:
* CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
(මෙම පුවත, Daily Mirror පුවත්පතේ සහෝදර සිංහල භාෂා පුවත්පත වන ලංකාදීප තුළ ද, 11 වෙනි පිටුවෙහි, දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ ඉහත මාධ්‍ය මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් පළ වී තිබිණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

✖ දිවි තොර කරගත් ආකාරය සඳහන් කර ඇත.

✖ පුවත්පතේ මුල් පිටුවෙහි පළ කර ඇත.

✖ හදිසි උපකාරක අංක සඳහන් කර නැත.

# Jeweller [redacted] following female employee's suicide



BY ROMESH MADUSHANKA

A 50-year-old Jewellery store owner in Jaffna has allegedly committed suicide after reportedly finding out that a 21-year-old female employee of the store had committed suicide after allegedly [redacted] in her house.

SEE REST OF THE STORY ON A2

Daily Mirror 2023-03-16